සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 08 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව

**නම/විභාග අංකය :- ..........................................................** **කාලය: පැය 02 යි.**

### I කොටස

- 01 - 20 දක්වා ඇති සියළුම ප්‍රශ්න වලට දී ඇති උපදෙස් අනුව පිළිතුරු සපයන්න.
- අංක 01 - 05 දක්වා ප්‍රශ්න වල හිස්තැන් වලට නිවැරදි පිළිතුරු යොදා සම්පූර්ණ කරන්න.

---

(01) සෞරග්‍රහ මණ්ඩලයේ ප්‍රධානියා ..................................... වේ.

(02) පෘථිවියේ ප්‍රධාන ඍතු අතුරින් හිම හා අයිස් ක්‍රමයෙන් දිය වී. අක්‍රියව පැවති ශාක නැවත දළු ලා වැඩී, මල් හා එල හට ගන්නේ...................................... ඍතුවේ දී ය.

(03) දකුණු ආසියානු කලාපීය රටක් වන නේපාලයේ අගනුවර ....................................... ය.

(04) දකුණු ආසියානු කලාපයට අයත් රටවල් අතුරින් කඳුකර භූ දර්ශනයට අයත් ලක්ෂණ දක්නට නොමැති එකම රට .................................. ය.

(05) ශ්‍රී ලංකාවේ පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා දුර කිලෝ මීටර ....................................... කි.

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ඇති වගන්ති කියවා 'හරි' නම් ✓ ලකුණ ද 'වැරදි' නම් × ලකුණ ද වරහන තුල යොදන්න.**

(06) සුන්දර බාන්ස් වගුරු බිම පිහිටා ඇත්තේ බංගලාදේශය ( )

(07) උත්තර ධ්‍රැවය හා දක්ෂිණ ධ්‍රැවය සම්බන්ධ කරමින් නිර්මාණය කර ඇති කල්පිත රේඛා සමූහය අක්ෂාංශ නම් වේ. ( )

(08) දකුණු ආසියානු කලාපයේ දැකිය හැකි ප්‍රධාන කාන්තාරය අරාබි කාන්තාරයයි. ( )

(09) හිමාලය කඳුකරයෙන් ආරම්භ වී බෙංගාල බොක්කෙන් මුහුදට වැටෙන විශාලම ගංගාව සින්ධු නදියයි. ( )

(10) උස් බිම් දෙකක් අතර පිහිටි පහත් බිම් නිම්නයක් ලෙස හැඳින්වේ. ( )

- 11 -15 දක්වා ප්‍රශ්න වල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

(11) වායුගෝලයේ වැඩිපුරම දක්නට ලැබෙන වායුව වන්නේ,
(1) ඔක්සිජන් ය. (2) නයිට්‍රජන් ය. (3) කාබන්ඩයොක්සයිඩ් ය. (4) ආගන් ය.

(12) දකුණු ආසියානු කලාපයේ පිහිටුවා ඇති දේශපාලන සංවිධානයක් වන සාර්ක් සංවිධානයට ඇතුළු කරගෙන ඇති මධ්‍යම ආසියාවට අයත් රට වනුයේ,
(1) පාකිස්ථානය යි. (2) නේපාලය යි. (3) ඇෆ්ගනිස්ථානය යි. (4) නිකොබාර් දූපත් ය.

(13) ජාත්‍යන්තරව පිළිගත් වේලාවන් භාවිතා කිරීම සඳහා පෘථිවිය, දේශාංශ පදනම් කරගත් සම්මත වේලා කලාප කීයකට බෙදා තිබේ ද?
(1) 24 යි (2) 15 යි (3) 16 යි (4) 20 යි

(14) වැලිතලා සහිත පැතුරුණු භූමිය මී. මී 250 ට අඩු වර්ෂාව, අධික වාෂ්පීකරණයක් පැවතීම වැනි ලක්ෂණ පෙන්නුම් කරන භූ දර්ශනයක් දැකිය හැකි වන්නේ,
(1) වෙරළ භූ දර්ශනයේ (2) කාන්තාර භූ දර්ශනයේ
(3) නිම්න භූ දර්ශනයේ (4) ග්‍රාමීය භූ දර්ශනයේ

(15) 1 : 50000 සිතියම් මත රතු පැහැයෙන් +--+--+-- ලෙස දක්වා ඇත්තේ කුමන පරිපාලන මායිම ද?
(1) පළාත් මායිම (2) දිස්ත්‍රික්ක මායිම
(3) උප දිසාපති කොට්ඨාස මායිම් (4) නගර සභා සීමා

- ප්‍රශ්න අංක **A** හා **B** නිවැරදිව ගලපන්න.


| | A | B |
|---|---|---|
| (16) | සෞරග්‍රහ මණ්ඩලයේ පිහිටි උෂ්ණත්වය අධිකතම ග්‍රහලෝකය | අඟහරු |
| (17) | 'රතු ග්‍රහයා' නමින් හැඳින්වේ | සිකුරු |
| (18) | ජීවීන් වාසය කරන එකම ග්‍රහලෝකය | සෙනසුරු |
| (19) | ග්‍රහලෝක අතුරින් විශාලතම ග්‍රහලෝකය | පෘථිවිය |
| (20) | දර්ශනීයම වළලු පද්ධතියන් පිහිටා ඇති ග්‍රහලෝකය | බ්‍රහස්පති |

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) (i) යාබ ද සිතියමෙහි A B C හා D නමින් නම් කොට ඇති රටවල් මොනවාදැයි වරහන තුලින් තෝරා පිළිවෙලින් ලියන්න.

(බංගලාදේශය, භූතානය, ඉන්දියාව පාකිස්ථානය, නේපාලය)





A - ........................................ C - ........................................

B - ........................................ D - ........................................


(ලකුණු 08)

(ii) පහත දැක්වෙන භූ ලක්ෂණ නම් කරන්න.


A




B




C



........................................ ........................................ ........................................

(ලකුණු 06)

(iii) පහත දැක්වෙන ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

(a) සූර්යයාගේ මතුපිට උෂ්ණත්වය කොපමණ ද? ................................................................

(b) පෘථිවියේ පරිභ්‍රමණය සඳහා ගත වන කාලය නිවැරදිව ලියන්න. ..................................................

(c) 1 : 50,000 සිතියම් මත පාසල දැක්වෙන සම්මත සලකුණ ඇඳ දක්වන්න. ........................................

(ලකුණු 06)

(02) (i) සෞරග්‍රහ මණ්ඩලයට අයත් අභ්‍යවකාශ වස්තූන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) සෞරග්‍රහ මණ්ඩලයේ අභ්‍යන්තර ග්‍රහලෝක තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) සූර්යයාගේ විශේෂ ලක්ෂණ ලියන්න. (ලකුණු 05)

(03) (i) සිකුරු ග්‍රහයා හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) සෞරග්‍රහ මණ්ඩලයට අයත් වාමන ග්‍රහයින් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(iii) සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳ බැඳී පවතින විශ්වාස තුනක් නම් කරන්න. (ලකුණු 05)

(04) (i) පෘථිවිය මතුපිට ඕනෑම තැනක පිහිටීම හඳුනා ගැනීමට, පෘථිවිය වටා නිර්මාණය කර ඇති කල්පිත රේඛා සමූහය හඳුන්වන නම් දෙක ලියන්න. (ලකුණු 02)

(ii) පෘථිවි භ්‍රමණය යන්න කෙටියෙන් හඳුන්වා පෘථිවි භ්‍රමණය නිසා ඇතිවන ප්‍රධාන ප්‍රතිඵල දෙක ලියන්න. (ලකුණු 03)

(iii) අනෙකුත් ග්‍රහ ලෝක වලට වඩා පෘථිවියේ ඇති සුවිශේෂී ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 05)

(05) (i) a) දකුණු ආසියානු කලාපයට අයත් විශාලතම රට කුමක් ද?

b) දකුණු ආසියානු කලාපයට අයත් ද්වීපත් රාජ්‍යයක් නම් කරන්න. (ලකුණු 02)

(ii) හිමාලය කඳුකරයේ ජීවත් වන ගෝත්‍රික ජන වර්ග තුනක නම් ලියන්න. (ලකුණු 03)

(iii) කඳුකර ප්‍රදේශ වල ජීවත් වන මිනිසුන්ගේ ශරීර ස්වභාවය ද කඳුකර පරිසරයට අනුව හැඩ ගැසී ඇත. කඳුකර මිනිසුන් තුල දැකිය හැකි එවැනි ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 05)

(06) (i) වෙරළබඩ භූ දර්ශනයේ ජීවත් වන වැසියන්ගේ කැපී පෙනෙන ආර්ථික කටයුතු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ධීවර කර්මාන්තය ආශ්‍රිත මානුෂ ක්‍රියාකාරකම් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) දකුණු ආසියාවේ නාගරික භූ දර්ශනය තුල පවතින ගැටළු තුනක් ලියන්න. (ලකුණු 05)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 08 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව - පිළිතුරු පත්‍රය

I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | සූර්යයා | (06) | ✓ | (11) | 2 | (16) | සිකුරු |
| (02) | වසන්ත | (07) | × | (12) | 3 | (17) | අඟහරු |
| (03) | කත්මණ්ඩු | (08) | × | (13) | 1 | (18) | පෘථිවිය |
| (04) | මාලදිවයින | (09) | × | (14) | 2 | (19) | බ්‍රහස්පති |
| (05) | 432 km | (10) | ✓ | (15) | 1 | (20) | සෙනසුරු |

(ලකුණු 2 × 20 = 40 )

**II පත්‍රය**

(01) (i) A පකිස්ථානය B ඉන්දියාව
C නේපාලය D බංගලාදේශය

(ii) A කොත් කන්ද B කඳු වැටිය C කපොල්ල

(iii) a - $6000^0$

b - දින 365 පැය 6

c - 

(02) (i) සූර්යයා, ග්‍රහලෝක, වාමන ග්‍රහයින්, උපග්‍රහයින්, පාෂාණ කැබලිති

(ii) බුධ. සිකුරු. පෘථිවි, අඟහරු

(iii)
- පෘථිවිය මෙන් 109 ගුණයක් පමණ විශාලය
- සූර්යයා ශක්ති ප්‍රභවයකි.
- සෞරග්‍රහ මණ්ඩලයට අයත් සියළුම ග්‍රහලෝක සඳහා ශක්තිය හා තාපය ලබා දෙයි.
- සූර්යයා මතුපිට සූර්ය කුණාටු ඇති වේ.

(03) (i) පහන් තරුව, ඉරබටු තරුව

(ii) ප්ලූටෝ, ඒරිස්, සෙරිස්, මාකේ - මාකේ, හෝමියා

(iii) - හිරු හා සඳු දේවත්වයේ ලා සලකා වන්දනා කිරීම.
- හිරු සඳු හා ග්‍රහයන් පදනම් කරගෙන ජ්‍යොතිර් විද්‍යාව නිර්මාණය වී තිබීම.
- ග්‍රහ බලපෑමෙන් අපල උපද්‍රව සිදුවේ යැයි විශ්වාස කිරීම හා ඒවාට ග්‍රහ ශාන්ති කර්ම පැවැත්වීම.
- උපන් වේලාවේ ග්‍රහ පිහිටීම සලකා ජන්ම පත්‍ර සැකසීම.
- හිරු හා සඳු පදනම් කරගත් විවිධ උත්සව පැවැත්වීම.

(04) (i) අක්ෂාංශ දේශාංශ

(ii)
- පෘථිවිය තම අක්ෂය වටා කැරකීමයි.
- දිවා රාත්‍රී ඇතිවීම.
- වේලාවේ ප්‍රාදේශීය වෙනස්කම් ඇතිවීම.

(iii)
- ජීවීන්ට හිතකර වායුන්ගෙන් සමන්විත වීම.
- ජලය පැවතීම.
- ජල වාෂ්ප සහිත වායුගෝලයක් පැවතීම.
- මධ්‍යස්ථ උෂ්ණත්වයක් පැවතීම.
- භ්‍රමණය හා පරිභ්‍රමණය සිදුවීම.
- ගුරුත්වාකර්ෂණ බලය පැවතීම.

(05) (i) a. ඉන්දියාව b. මාලදිවයින් / ශ්‍රී ලංකාව

(ii) භූටියා, කසා, දරඩ්, ලෙප්චා, ෂෙර්පා

(iii)
- පුළුල් පතුල් සහිත පාද
- බර ඉසිලීමට හැකි ලෙස ශක්තිමත් වූ බාහු
- අඩු ඔක්සිජන් වායුවෙන් ජීවත් වීමට හැකි අයුරින් සකස් වූ පෙනහළු

(06) (i) ධීවර කර්මාන්තය, සංචාරක ව්‍යාපාරය

(ii)
- මාළු වෙළඳාම
- කරවල වේලීම
- උම්බලකඩ සෑදීම
- මාළු ටින් කිරීම
- සිප්පි කටු විසිතුරු භාණ්ඩ
- වෙනත් අතුරු නිශ්පාදන

(iii)
- ඉඩම් හිඟය
- මාර්ග තදබදය
- පරිසර දූෂණය
- වීදි ජනයා බහුල වීම
- අඩු ආදායම් ජනාවාස බහුල වීම
- අපචාර බහුල වීම